ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

# ඉංග්‍රීසි භාෂාව පිළිබඳ බාහිර පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ආරම්භ කිරීමට නියමිත පහත සඳහන් පාඨමාලා සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර) - Advanced Certificate in English (External)

- පාඨමාලා කාලය : මාස - 08
- SLQF ස්ථරය : 02 වන ස්ථරය (Level 02)
- ඉගැන්වීම් මාධ්‍යය : ඉංග්‍රීසි
- **මූලික සුදුසුකම් :**
  1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) / මූලික පිරිවෙන් අවසන් විභාගයේ ඉංග්‍රීසි විෂය (සාමාන්‍ය "S" සාමර්ථ්‍යයක් තිබීම ප්‍රමාණවත් වේ) සහිතව විෂයන් හයක් (06) සමත් වීම.
     **හෝ**
  2. ඒ හා සමාන පිළිගත හැකි වෙනත් සුදුසුකම් ලබා තිබීම.
     **හෝ**
  3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ සුදුසුකමක් සපුරා තිබීම.

- පාඨමාලා ගාස්තුව : අයදුම්පත් ගාස්තුව - **රු.** 500.00
  පාඨමාලා ගාස්තුව - **රු.** 14,000.00

## 2. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර) - Diploma in English (External)

- පාඨමාලා කාලය : මාස - 12 (වසර 01)
- SLQF ස්ථරය : 03 වන ස්ථරය (Level 03)
- ඉගැන්වීම් මාධ්‍යය : ඉංග්‍රීසි
- **මූලික සුදුසුකම් :**
  1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඕනෑම විෂයයන් තුනක් සහිතව සමත් වීම.
     **හා**
     අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී හෝ මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් ලබා තිබීම.
     **හෝ**
  2. SLQF 02 වැනි ස්තරයට සමාන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
     **හෝ**
  3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

- පාඨමාලා ගාස්තුව : අයදුම්පත් ගාස්තුව - **රු.** 1,000.00
  පාඨමාලා ගාස්තුව - **රු.** 18,000.00

---

- මෙම පාඨමාලාවන් සඳහා ඉහත දක්වා ඇති අදාළ සුදුසුකම් සපුරන ගිහි/ පැවිදි/ ස්ත්‍රී/ පුරුෂ ඕනෑම අයෙකුට ඉල්ලුම් කළ හැකිය.
- පාඨමාලා මාර්ගගත ක්‍රමයට (Online) හා සම්මුඛ ලෙස අවස්ථානුකූලව පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.
- පාඨමාලා ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය පිරිසක් අයදුම්කර තිබිය යුතුය.

**අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම**

- අයදුම්පත් හා විස්තර පත්‍රිකා විශ්වවිද්‍යාල නිල වෙබ් අඩවියෙන් (www.busl.ac.lk) බාගත (download) හැකිය.

**අයදුම්පත් භාර දීම**

- අයදුම්පත් යොමු කිරීමේ දී අදාළ පාඨමාලාවට නියමිත අයදුම්පත් ගාස්තුව ගෙවා ඊට අදාළ අයදුම්පත භාවිත කර අයදුම් කළ යුතුය.

- දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක 008-1001-7001-4461 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව බැර කිරීමෙන් ලබාගන්නා ලදුපත හා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලියකියවිලි සමග 2022.06.20 දින හෝ එදිනට පෙර "**සහකාර ලේඛකාධිකාරි, පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර**" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**...................................පාඨමාලාව (බාහිර) සඳහා අයදුම් කිරීම** 2021/2022" ලෙස සඳහන් කළ යුතුය.
  **(මහජන බැංකුවේ ගිණුම් අංකයට මුදල් බැර කරන විට ලදුපතෙහි හේතුව යන තීරයේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කිරීම අනිවාර්ය වේ)**
  1. උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්
  2. පැවිදි අයදුම්කරුවන් සඳහා සාමණේර/උපසම්පදා සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්
  3. ජාතික හැඳුනුම්පතේ සහතික කළ ඡායා පිටපතක්
  4. අධ්‍යාපන සහතිකවල සහතික කළ ඡායා පිටපත්
  5. අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපතෙහි මුල් පිටපත
  6. මුද්දර ඇල වූ (ලියාපදිංචි තැපැල සඳහා) තම නම ලිපිනය ලියන ලද ලිපි කවර දෙකක්

වැඩි විස්තර - පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025-2057978)
විශ්වවිද්‍යාල වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර.